# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/40 - 2022 අගෝස්තු මස 10 වැනි බදාදා - 2022.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ අංක 08 කොක්කොඩිචෝලෙයි කොට්ඨාසයට තේරී පත් වූ පිල්ලෙයියාන්කුට්ටි තේවනේසරාසා අයත් වන්නා වූ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ අංක 08 කොක්කොඩිචෝලෙයි කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කන්දයියා ඉරත්තිනකුමාර් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද,

මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරමින් කන්දයියා ඉරත්තිනකුමාර්, මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ අංක 08 කොක්කොඩිචෝලෙයි කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

එම්. බී. එම්. සුෆ්යාන්,<br>
තේරීම්භාර නිලධාරි,<br>
මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 10 වැනි දින,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>
මඩකලපුව.

EOG 08 - 0108